# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2026.09.04 මාධ්‍ය නිවේදන අංක **2026/093**

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ගුවන් සමාගමට ගුවන් යානා මිලදී ගැනීමට අදාල ගනුදෙනුවේදී රුපියල් මිලියන 100ක අල්ලස් ලබාගැනීමේ චෝදනාවකට අදාලව පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් නාමල් රාජපක්ෂ යන අය අත්අඩංගුවට**

ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ගුවන් සමාගමට ගුවන් යානා මිලදී ගැනීමට අදාල ගනුදෙනුවේදී සිංගප්පූරුවේ ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ BIZ Solutions INC නැමති ගිණුමට අල්ලස් වශයෙන් ලද යූරෝ 1,454,651.24 ක මුදලින්, ඇමෙරිකානු ඩොලර් 800,000 ක මුදලක්ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයෙකු වෙත හිමිකාරීත්වය ඇති Sabre Vision Holdings LTD සමාගමේ නමින් සිංගප්පූරුවේ පිහිටි OCBC බැංකුවේ ගිණුමක් වෙත තැන්පත් කරවාගෙන, එම මුදලට සමාන වන අයුරින් ශ්‍රී ලංකා රුපියල් 100,000,000.00 (මිලියන 100)ක මුදලක් ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයෙකු අතින් 2014, 2015 වර්ෂ වල අවස්ථා කීපයකදී අල්ලස් ලෙස ලබාගැනීම යන චෝදනාව මත පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් නාමල් රාජපක්ෂ යන අය 2026.09.04 වන දින ප.ව. 02.09 ට පමණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදි.

ඒ සම්බන්ධයෙන් අදාළ ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයාගේ ප්‍රකාශයෙන් සහ ප්‍රංශයේ Airbus සමාගමේ නිලධාරීන් කොමිෂන් සභාවට පැමිණ ලබාදුන් ප්‍රකාශයන්ද මෙන්ම මීට අදාලව රැස්කරන ලද ලේඛණ හා අනෙකුත් තොරතුරු මත පදනම්ව සිදුකරගෙන යනු ලබන විමර්ශනයට අදාලව මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරු කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිත ය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව